මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/03 - 2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.09. 21

**අයවැය චක්‍රලේඛ අංක: 06/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2022 සංශෝධිත ඇස්තමේන්තු යටතේ වියදම් දැරීම සඳහා බලය දීම, 2022 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය හා ගිණුම් තැබීම**

**2022 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත**

2022 මුදල් වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබාදී තිබූ 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කරමින් 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත 2022.09.02 දින පාර්ලිමේන්තුවේදී සම්මත විය. ඒ අනුව 2022 සමස්ත වර්ෂය තුළ රජයේ වියදම් දැරීමේදී 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතේ සීමාවන් අභිබවා නොයන පරිදි සිදු කළ යුතු ය.

2. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) අනුව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2022 අංක 21 දරන විසර්ජන පනතට අනුව වියදම් දැරීම සඳහා අදාල අධිකාරී බලපත්‍ර ගරු මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

3. ඒ අනුව, 2022.09.12 දිනෙන් පසුව 2022 මුදල් වර්ෂයට අදාළ ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය පොදු සේවා සඳහා | - | 2022 අංක 04 දරන සාමාන්‍ය බලපත්‍රය |
| විශේෂ නීති සේවා කටයුතු සඳහා | - | 2022 අංක 04 දරන විශේෂ නීති අධිකාරී බලය |
| අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා | - | 2022 අංක 04 දරන අත්තිකාරම් බලපත්‍රය |

4. 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතෙහි සඳහන් වියදම් ඇස්තමේන්තු සකස් කර ඇත්තේ 2021 අංක 30 දරන විසර්ජන පනතට පහත ගැලපීම් සිදුකරමිනි.

I. 2022.06.08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තුවේ ඇතුලත් වූ රු. බිලියන 695 ක ප්‍රතිපාදන, සංශෝධිත අයවැය ඇස්තමේන්තු 2022 ට ඇතුලත් කිරීම.

II. පවත්නා තත්ත්වය තුල ප්‍රමුඛතාවයෙන් අඩු ලෙස සැලකිය හැකි හා ප්‍රායෝගික හේතු මත ක්‍රියාත්මක කිරීමට අපහසු ව්‍යාපෘති/දැරීමට අපහසු වියදම් වෙනුවෙන් 2021 අංක 30 දරන විසර්ජන පනත මගින් වෙන්කර තිබූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් රු. බිලියන 300 ක් අවුරා තබන ලද අතර ඊට අදාලව ඒ ඒ වැය ශීර්ෂ හා වැය විෂය විස්තර යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන සංශෝධිත අයවැය ඇස්තමේන්තු තුලින් ඉවත් කිරීම.

III. 2022.01.01 සිට 2022.07.15 දක්වා කාලපරිච්ඡේදය තුල විසර්ජන පනතේ 6(1) උප වගන්තියට අනුකූලව සපයා ඇති අතිරේක ප්‍රතිපාදන අදාල වැය ශීර්ෂ හා වැය විෂය විස්තර යටතේ සංශෝධිත අයවැය ඇස්තමේන්තු 2022 ට ඇතුලත් කිරීම.

IV. 2022.01.01 සිට 2022.07.15 දක්වා කාලපරිච්ඡේදය තුල ITMIS පද්ධතිය හරහා මුදල් රෙගුලාසි 66 - වීරමොන් ක්‍රියා පටිපාටිය යටතේ සිදුකරන ලද මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම් සුදුසු පරිදි සංශෝධිත අයවැය ඇස්තමේන්තු 2022 ට ඇතුලත් කිරීම.

V. පවත්නා මිල ගණන් හා වෙනත් අවශ්‍යතාවයන්ට අනුකූලව 2022 වර්ෂය සඳහා තවදුරටත් අවශ්‍යවන වියදම් සඳහා යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් සංශෝධිත අයවැය ඇස්තමේන්තු 2022 ට ඇතුලත් කිරීම

VI. 2021 අංක 30 දරන විසර්ජන පනත සම්මත වූ අවස්ථාවේදී පැවති අමාත්‍යාංශ ව්‍යුහය මේ වන විට වෙනස්වී ඇති අතර 2022 සංශෝධිත අයවැය පාර්ලිමේන්තුවේ සම්මත වන දිනට පැවති අමාත්‍යාංශ ව්‍යුහයට අනුකූලව ඉහත පරිදි සකස් කල සංශෝධිත අයවැය ව්‍යුහගත කර ඇත. ඒ අනුව අහෝසි වූ රාජ්‍ය අමාත්‍යාංශ හා කැබිනට් අමාත්‍යාංශවලට අදාල අයවැය ප්‍රතිපාදන ඒවායේ විෂයපථයන් අයත් වූ නව කැබිනට් අමාත්‍යාංශවල වැය ශීර්ෂ යටතේ ඇතුලත් කර ඇත. අහෝසි වූ එම අමාත්‍යාංශවලට අදාල ව්‍යාපෘති වෙන්ව හඳුනාගත හැකි පරිදි ඇස්තමේන්තුවල දක්වා ඇත.

5. ඒ අනුව, 2022 සමස්ත මූල්‍ය වර්ෂයටම අදාල වන වියදම් සීමාවන් 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත හා සංශෝධිත අයවැය ඇස්තමේන්තුවලට අනුකූල විය යුතු බව යලි අවධාරණය කරමි. එහිදී 2022.01.01 සිට 2022.07.15 දක්වා කාලපරිච්ඡේදය තුල විසර්ජන පනතේ 6(1) උප වගන්තියට අනුකූලව සපයා ඇති අතිරේක ප්‍රතිපාදන හා මුදල් රෙගුලාසි 66 - වීරමොන් ක්‍රියා පටිපාටිය යටතේ සිදුකරන ලද මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම් සංශෝධිත අයවැය ඇස්තමේන්තු තුල ඇතුලත්ව ඇති බැවින් ඒවා අහෝසි වූ ලෙස සැලකිය යුතු ය.

**2022 සංශෝධිත අයවැය ඇස්තමේන්තු ITMIS පද්ධතිය මගින් ක්‍රියාත්මක කිරීම**

6. තාක්ෂණික සීමාවන් හේතුවෙන් 2022 සංශෝධිත විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන වැය ශීර්ෂ හා වැය විෂය විස්තර අනුව ITMIS පද්ධතිය හරහා අයවැය ක්‍රියාත්මක කිරීම සිදුකල හැක්කේ 2022.10.01 දින සිට ඉදිරියට වේ. ඒ අනුව 2022 සංශෝධිත ඇස්තමේන්තුවල සීමාවන් අභිබවා නොයන පරිදි ඒ ඒ වැය විෂය විස්තරයට අදාල පෙර පැවති අනුරූපී වැය විෂයන් යටතේ එම දින දක්වා අක්මුදල් නිදහස් කිරීම හා ගනුදෙනු වාර්තා කිරීමට සිදුවී ඇත.

7. යම් ආයතනයකට, අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා දැනට තෙවන කාර්තුව සඳහා වෙන්කර ඇති වියදම් සීමාවන් ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ සඳහා අවශ්‍ය සංශෝධන සිදු කර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ඉල්ලීම් කළ යුතු ය. අයවැය යෝජනා වැනි අනුරූපී වැය විෂයක් නොමැති අවස්ථාවන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර සුදුසු විකල්ප වැඩ පිළිවෙලක් සකස් කරගත හැක.

## වියදම් වාර්තාකරණය හා ගිණුම් තැබීම

8. 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 2021 අංක 30 දරන විසර්ජන පනතට අදාල වැය ශීර්ෂ හා වැය විෂයන් යටතේ 2022.01.01 සිට 2022.09.30 දක්වා වාර්තා වන වියදම් මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි 2022 සංශෝධිත අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන අනුරූපී වැය ශීර්ෂ හා වැය විෂයන් අනුව ගලපා සිදුකළ යුතු වේ.

9. මේ සමඟ අමුණා ඇති ඇමුණුම I හි 1 තීරුවෙන් 2022 සංශෝධිත ඇස්තමේන්තුවල අන්තර්ගත වැය ශීර්ෂ දැක්වේ. එම වැය ශීර්ෂ යටතේ අංක 2 තීරුවේ දැක්වෙන වැය විෂය විස්තරවලට අනුරූපී 2022 මුල් අයවැය ඇස්තමේන්තු (2021 අංක 30 දරන විසර්ජන පනත) වල සඳහන් වැය විෂය විස්තර 3 තීරුවේ දක්වා ඇත. ඒ අනුව, 2022.01.01 සිට 2022.09.30 දක්වා 3 තීරුවේ වැය විෂයන් යටතේ වාර්තා වන වියදම් ජර්නල් මාරු කිරීම් මගින් 2 තීරුවේ අනුරූපී නව වැය විෂය විස්තරවලට 2022 ඔක්තෝම්බර් 31 දිනට පෙර "හර" කළ යුතු ය. ඔක්තෝම්බර් මස ගිණුම් සාරාංශයන් වාර්තා කළ යුත්තේ එම ගැලපීම් සිදුකිරීමෙන් පසුව බව අවධාරණය කරමි.

10. 2022.10.01 දින සිට ITMIS පද්ධතිය තුල නව වැය ශීර්ෂ හා නව වැය විෂය විස්තර අනුව අයවැය සීමාවන් ඇතුලත් කරනු ඇත. ඒ අනුව වර්ෂයේ ඉදිරි කාලය සඳහා වන වියදම් වාර්තාකරණය නව වැය ශීර්ෂ හා නව වැය විෂය විස්තර යටතේ සිදු කිරීමට හැකිවනු ඇත.

## නව රාජ්‍ය අමාත්‍යවරුන්ට අදාල වියදම්

11. 2022.09.08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අමාත්‍යවරුන් පත් කර ඇති අතර මේ අවස්ථාවේදී එම රාජ්‍ය අමාත්‍යවරුන් සඳහා වෙනම වැය ශීර්ෂයක් වෙන් කිරීමට අදහස් නොකරන බව ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/12 දරන 2022.09.09 දිනැති චක්‍රලේඛ ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව හැකිතාක් දුරට අදාල කැබිනට් අමාත්‍යාංශය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන සුදුසු පරිදි භාවිත කර රාජ්‍ය අමාත්‍යවරුන්ට අදාල වියදම් ආවරණය කරගත යුතු ය. එසේ කිරීමට නොහැකි අවස්ථාවලදී අවශ්‍ය අමතර ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කළ යුතු වේ. අදාල වියදම් දැරීමේදී ජනාධිපති ලේකම්තුමන් විසින් නිකුත්කර ඇති අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/1 දරන 2022.09.09 සහ අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/12 දරන 2022.09.12 දිනැති චක්‍රලේඛ ලිපිවල දැක්වෙන වියදම් සීමාවන්ට අනුකූල විය යුතු වේ.

12. ඉහත කරුණු සම්බන්ධයෙන් යම් ගැටළුවක් හෝ නොපැහැදිලිතාවයක් මතු වුවහොත් අයවැය දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරීන් විමසා හෝ දුරකථන අංක 011 – 2484681 ඔස්සේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගත හැකි වේ.

## අක්මුදල් නිදහස් කිරීම

13. 2022 සංශෝධිත ඇස්තමේන්තු පදනම් කරගෙන වර්ෂයේ ඉදිරි කාලය තුල අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාරය කටයුතු කරනු ඇත. 2022.10.01 දින සිට අක්මුදල් සීමාව ගණනය කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත. එතෙක් දැනටමත් අනුගමනය කරන ක්‍රමවේදයම ඉදිරියටත් පවත්වා ගත යුතු වේ.

## අත්තිකාරම් ගිණුම් කටයුතු

14. 2021 අංක 30 විසර්ජන පනත මගින් සම්මත කරන ලද අත්තිකාරම් ගිණුම්වල සීමා ඇතුලත් තෙවන උපලේඛණය 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත මගින් ප්‍රතියෝජනය කර ඇත. එහිදී ඇමුණුම I හි සඳහන් ගැලපීම්වලට අනුකූල වන පරිදි අහෝසි වූ අමාත්‍යාංශවලට අදාල වූ අත්තිකාරම් ගිණුම් සීමාවන් නව අමාත්‍යාංශවලට අදාල සීමාවන් තුලට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2022 වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ සීමාවන් 2022 සංශෝධිත අයවැය ඇස්තමේන්තුවල III කොටසේ හා/හෝ 2022 අංක 21 දරන විසර්ජන පනතේ උපලේඛන III යටතේ දක්වා ඇති සීමාවන්ට යටත්ව සිදු කළ යුතු වේ.

15. ගිණුම් තැබීමේදී, සම්පූර්ණයෙන් අහෝසි වූ අමාත්‍යාංශවල අත්තිකාරම් ගිණුම් ශේෂයන් ඉතිරි නොවන පරිදි අදාල නව අමාත්‍යාංශ වෙත පැවරිය යුතු ය. යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කටයුතු නව අමාත්‍යාංශ දෙකකට හෝ කිහිපයකට පැවරී ඇති විටෙක අමාත්‍යාංශ අතර කාර්යමණ්ඩලය හුවමාරුවීමට අනුකූල වන සේ අදාල ණය ශේෂයන් මාරුකර නොවැම්බර් 15 දිනට පෙර රාජ්‍ය ගිණුම්

දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කළ යුතු ය. අත්තිකාරම් ගිණුම් පියවා නිරවුල් කිරීමේ වගකීම අහෝසි වන වැය ශීර්ෂවල සේවය කළ ප්‍රධාන මූල්‍ය නිළධාරී/ප්‍රධාන ගණකාධිකාරී වෙත පැවරේ. අත්තිකාරම් ගිණුම් කටයුතු නිරවුල් කිරීමේදී යම් ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දුරකථන අංක 011-2484733 හෝ 011-2484826 ඔස්සේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ඇමතීමෙන් ලබාගත හැක.

16. ඉහත පරිදි කටයුතු කිරීම හේතුවෙන් නව වැය ශීර්ෂ යටතේ වන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් වල දී ඇති සීමාවන් සඳහා යම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා වන ඉල්ලීම්, **නොපමාව**, නියමිත ක්‍රමවේදයන්ට අනුකූලව, 2022.12.31 දිනට ප්‍රථම භාණ්ඩාගරය වෙත ඉදිරිපත් කළ යුතුය.

17. තවද 2022 වාර්ෂික අවසන් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට හැකිවන ලෙස 2023.02.28 දිනට ප්‍රථම අත්තිකාරම් ගිණුම්වල සංශෝධන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අදාල අනුමැතිය ලබාගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන බැවින් සීමා සංශෝධනය සඳහා වන ඉල්ලීම් **2022.12.31 දිනට ප්‍රථම** අදාල පරිදි අමාත්‍ය මණ්ඩලය හෝ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර තිබිය යුතු බව දැඩිව අවධාරණය කරමි.

### අනුමත අග්‍රිම ගිණුම් සහ නිල බැංකු ගිණුම්

18. අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාල අක්‍රීය නිල බැංකු ගිණුම් සහ අනුමත අග්‍රිම ගිණුම් වසා දැමීමේ කාර්යයේ වගකීම අහෝසි වූ අමාත්‍යාංශවල සේවය කළ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී වෙත මෙයින් පවරනු ලැබේ. මෙම කාර්යය සඳහා වැඩිදුරටත් උපදෙස් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා දුරකථන අංක 011-2484738 ඔස්සේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ) ඇමතිය යුතු ය.

### තැන්පතු ගිණුම්

19. යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට පමණක් එකතු වන විට අහෝසි වූ අමාත්‍යාංශය යටතේ වූ තැන්පත් ගිණුම් එම ගිණුම් අංක යටතේම නව අමාත්‍යාංශය යටතට පවරාගත යුතු ය. යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කාර්යයන් වෙනත් අමාත්‍යාංශ කිහිපයකට පැවරෙන විටක අහෝසි වූ අමාත්‍යාංශයේ කාර්යයන් වැඩි ප්‍රමාණයක් පවරාගන්නා ලද නව අමාත්‍යාංශය විසින් අහෝසි වූ අමාත්‍යාංශයේ තැන්පතු ගිණුම් එම ගිණුම් අංක යටතේම පවරාගත යුතු ය. ඉන් අනතුරුව පෙර පැවති අමාත්‍යාංශයේ කාර්යයන් පැවරුණ අනෙකුත් අමාත්‍යාංශවලට අදාල වන තැන්පතු ශේෂ පවතී නම් ඒවා ජර්නල් සටහන් මගින් මාරු කිරීමට කටයුතු කළ යුතු ය. අදාල ජර්නල් සටහන් හා ලෙජර්වල ශේෂ 2022 ඔක්තෝම්බර් 31 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය. අහෝසි වන අමාත්‍යාංශවල ගිණුම් කටයුතු විධිමත් පරිදි අවසන් කිරීම හා ඉදිරියට ගෙන ආ යුතු ශේෂ නිසි පරිදි නව අමාත්‍යාංශවලට පවරා දීමේ වගකීම එවකට පැවති අමාත්‍යාංශවල ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට පැවරෙන අතර, එම ශේෂ පවරා ගැනීමේ වගකීම නව අමාත්‍යාංශවල ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට පැවරේ. මෙම කාර්යය සඳහා වැඩිදුරටත් උපදෙස් ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2440857 ඔස්සේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ඇමතීමෙන් ලබාගත හැක

### මූල්‍ය නොවන වත්කම් පැවරීම

20. අහෝසි වූ වැය ශීර්ෂ යටතේ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කල යුතු ය.

i. සම්පූර්ණයෙන් අහෝසි වූ වැය ශීර්ෂ යටතේ ගිණුම්ගත කර ඇති මූල්‍ය නොවන වත්කම් අහෝසි වූ වැය ශීර්ෂයේ කාර්යයන් පැවරුණ නව අමාත්‍යාංශයේ/අමාත්‍යාංශවල වැය ශීර්ෂයට/වැය ශීර්ෂවලට කාර්යයන් පැවරීමට අනුරූපීව සිදුකළ යුතු ය.

ii. යම් අමාත්‍යාංශයක වැය ශීර්ෂය අහෝසි නොවී පැවතියත් එහි කාර්යයන්හි කොටසක් වෙනත් වැය ශීර්ෂයකට හෝ කිහිපයකට පැවරී ඇති විට ද කාර්යයන් පැවරීමට අනුරූපී වන ලෙස මූල්‍ය නොවන වත්කම් ද අදාල පරිදි නව වැය ශීර්ෂවලට පැවරීමක් සිදු කළ යුතු ය.

21. ඉහත පරිදි කටයුතු කිරීමේදී වත්කම් අයත්ව තිබූ වැය ශීර්ෂයට අදාළ නිලධාරීන් විසින් පැවරුම්ලාභී වැය ශීර්ෂයේ අදාළ නිලධාරීන්ගේද එකඟතාවය සහිතව කටයුතු කළ යුතු ය. පැවරුම්ලාභී වැය ශීර්ෂවල අදාළ නිලධාරීන් විසින් පැවරුණ වත්කම් විධිමත් පරිදි තම වැය ශීර්ෂ යටතේ ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු ය.

22. මූල්‍ය නොවන වත්කම්වල ලෙජරයේ කේවල ශේෂවලට අනුකූල වන පරිදි වත්කම් පැවරීම සිදු කළ යුතු ය. කේවල ශේෂ ඇතුළත් මෘදු පිටපතක් (Soft copy) අදාළ ජර්නල් සටහන් සමඟ නොවැම්බර් 30 දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම මඟින් අදාළ වත්කම් පැවරීමේ කාර්යය වඩාත් පහසුවනු ඇත.

23. මේ වන විට ගිණුම් ගත කර නොමැති යම් මූල්‍ය නොවන වත්කමක් පැවරීමට නියමිත වන්නේ නම් එම වත්කම්හි විස්තරද පැවරුම්ලාභීන් වෙත නියමිත පරිදි ලබාදීමට පැවරුම්කාර වැය ශීර්ෂයට අදාළ නිළධාරීන් බැඳී සිටී. එසේම පැවරුම්ලාභී ශීර්ෂවල අදාළ නිළධාරීන් එම වත්කම් විධිමත් පරිදි තම වැය ශීර්ෂ යටතේ ගිණුම් ගත කිරීමට බැඳී සිටී.

### නිරවුල් නොකල බැරකම්

24. අහෝසි වූ වැය ශීර්ෂවලට අදාළව 2022.09.30 දිනට පවතින බැඳීම් හා බැරකම් ඒවාට අදාල ප්‍රතිපාදන පැවරීමට අනුරූපීව නව අමාත්‍යාංශ වෙත පැවරීමට කටයුතු කළ යුතු ය. පවරුන විෂයන්ට අදාල ප්‍රතිපාදන භාවිතයේදී බැරකම් නිරවුල් කිරීමට ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු ය.

### වැඩ හා කුලී අත්තිකාරම්

25. අහෝසිවන වැය ශීර්ෂවල දැනට විවෘත කර ඇති හා තවදුරටත් අයවීමට ශේෂ ඇති වැඩ හා කුලී අත්තිකාරම් ගිණුම්, අහෝසි වූ වැය ශීර්ෂයේ කාර්යයන් පැවරුන වැය ශීර්ෂ වෙත පවරා දීම සිදු කළ යුතු ය. වැය ශීර්ෂ අහෝසි නොවී එහි යම් කාර්යයන් පමණක් වෙනත් වැය ශීර්ෂයකට පැවරෙන අවස්ථාවල දී අවශ්‍ය වන්නේනම් පමණක් වැඩ හා කුලී අත්තිකාරම් ගිණුම් ද ඊට අනුරූපීව පවරාදීම සිදු කළ යුතු ය. මෙම ක්‍රියාවලිය 2022 නොවැම්බර් 30 දිනට පෙර අවසන් කළ යුතු ය.

26. ඒ අනුව වැඩ හා කුලී අත්තිකාරම් ගිණුම් ශේෂ පවරාදීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් පවරා දෙනු ලබන වැය ශීර්ෂ විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර එම වැඩ හා කුලී අත්තිකාරම් ශේෂ පවරා ගනු ලබන වැය ශීර්ෂ විසින් එම ශේෂ ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් තම වැය ශීර්ෂය යටතේ වෙන වෙනම ගිණුම් අංක ලබා ගත යුතු ය.

27. මූල්‍ය නොවන වත්කම්,නිරවුල් නොකළ බැරකම් හා වැඩ හා කුලී අත්තිකාරම් ශේෂ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් වැඩිදුරටත් උපදෙස් අවශ්‍ය නම් දුරකතන අංක 011-2484733 ඔස්සේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ඇමතීම මඟින් ලබා ගත හැක.

### 2022 වාර්ෂික ගිණුම් ප්‍රකාශ

28. ඉහත උපදෙස් පරිදි වියදම් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකිරීමෙන් අනතුරුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අවසන් ගිණුම් සැකසීම පිළිබඳ මාර්ගෝපදේශ අනුගමනය කරමින් 2022 වර්ෂය සඳහා ඒ ඒ වැය ශීර්ෂය වෙනුවෙන් වන වාර්ෂික ගිණුම් ප්‍රකාශ සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම කළ යුතු වේ.

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

Annexure 1

**Mapping the Provisions of the Appropriation Act No. 30 of 2021(Budget Estimates 2022) with the Appropriation Act No. 21 of 2022 (Revised Budget Estimates 2022)**

| 1 | 2 | 3 |
|---|---|---|
| New Expenditure Head as Per Revised Budget 2022 | Vote Particulars as per Revised Budget 2022 (Appropriation Act No. 21 of 2022) | Vote Particulars as per Initial Budget 2022 (Appropriation Act No. 30 of 2021) |
| **101** | **Ministry of Buddha Sasana, Religious and Cultural Affairs** | |
| | 101-01-03 | 101-01-03 except 101-01-03-001 (1503 &2201) and 101-01-03-002 (1508 & 2509) |
| | 101-01-07 | 401-01-01 |
| | 101-01-08 | 401-01-02 |
| | 101-02-09 | 401-02-03 |
| **102** | **Ministry of Finance, Economic Stabilization and National Policies** | |
| | 102-01-02 - 031 | 116-02-06-001 |
| | 102-01-02 -032 | 116-02-06-006 |
| | 102-01-02 -033 | 116-02-06-011 |
| | 102-01-02 -034 | 116-02-06-014 |
| | 102-01-02 | 102-01-02 except 102-01-02-25 , 102-01-02-26 & 102-01-02-27 |
| | 102-02-03-12 | 001-02-06-19 |
| | 102-1-12 | 104-1-01 |
| | 102-1-13 | 104-1-02 |
| | 102-01-14 | 169-01-01 |
| | 102-01-15 | 169-01-02 |
| | 102-01-16 | 116-01-03 |
| **103** | **Ministry of Defence** | |
| | 103-01-13 | 442-01-01 |
| | 103-01-14 | 442-01-02 |
| | 103-01-15 | 442-01-04 |
| | 103-01-16 | 442-01-05 |
| | 103-02-17 | 442-02-06 |
| | 103-02-18 | 442-02-07 |
| | 103-02-19 | 442-02-08 |
| **105** | **Ministry of Mass Media** | |
| | 105-02-04 - 009 (1503 & 2201) | 101-01-03-001 (1503 &2201) |
| | 105-02-04 - 010 (1508 & 2509) | 101-01-03-002 (1508 & 2509) |
| **110** | **Ministry of Justice, Prisons Affairs and Constitutional Reforms** | |
| | 110-01-06 | 418-01-01 |
| | 110-01-07 | 418-01-02 |
| **111** | **Ministry of Health** | |
| | 111-01-02- 016 - (1503/1509/2201) | 441-02-03-001 (1503/1509/2201) |
| | 111-02-14 - 2509 | 441-02-03-2509 |
| | 111-02-14 - 043 | 441-02-03-005 |
| | 111-01-11 | 416-01-01 |
| | 111-01-21 | 416-01-02 |
| | 111-02-19 | 416-02-03 |
| | 111-01-22 | 423-01-01 |

| New Expenditure Head as Per Revised Budget 2022 | Vote Particulars as per Revised Budget 2022 (Appropriation Act No. 21 of 2022) | Vote Particulars as per Initial Budget 2022 (Appropriation Act No. 30 of 2021) |
|---|---|---|
| | 111-02-25 | 423-01-02 , 423-02-03 |
| | 111-01-23 | 441-01-01 |
| | 111-01-24 | 441-01-02 |
| **112** | **Foreign Minister** | |
| | 112-02-02 | 112-02-02 except 112-02-02-005 |
| | 112-01-04 | 419-01-01 |
| | 112-02-05 | 419-01-02 |
| **116** | **Ministry of Trade ,commerce and Food Security** | |
| | 116-2-05- 09 | 426-2-3-10 |
| | 116-1-07 | 438-1-01 |
| | 116-1-08 | 438-1-02 |
| | 116-2-09 | 438-2-03 |
| | 116-2-06 | 116-2-06 except 116-02-06-001, 116-02-06-006, 116-02-06-011 & 116-02-06-014 |
| **117** | **Ministry of Transport and Highways** | |
| | 117-01-18 | 435-01-01 |
| | 117-01-19 | 435-01-02 |
| | 117-01-20 | 114-01-01 |
| | 117-01-21 | 114-01-02 |
| | 117-01-22 | 436-01-01 |
| | 117-01-23 | 436-01-02 |
| | 117-02-24 | 435-02-03 |
| | 117-02-25 | 114-02-03 |
| | 117-02-26 | 114-02-04 |
| | 117-02-27 | 436-02-03 |
| **118** | **Ministry of Agriculture** | |
| | 118-01-18 | 407-01-01 |
| | 118-01-19 | 407-01-02 |
| | 118-02-20 | 407-02-03 |
| | 118-01-21 | 426-01-01 |
| | 118-01-22 | 426-01-02 |
| | 118-02-23 | 426-02-03 except 426-2-3-10 |
| | 118-01-24 | 427-01-01 |
| | 118-01-25 | 427-01-02 |
| | 118-02-26 | 427-02-03 |
| **119** | **Ministry of Power & Energy** | |
| | 119-1-3 | 406-1-2 |
| | 119-1-4 | 115-1-1 |
| | 119-1-5 | 115-1-2 |
| | 119-1-11 | 406-1-1 |
| | 119-2-7 | 406-2-3 |
| **122** | **Ministry of Tourism and Lands** | |
| | 122-01-04 | 159-01-01 |
| | 122-01-05 | 159-01-02 |
| | 122-02-06 | 159-02-03 |
| **123** | **Ministry of Urban Development and Housing** | |
| | 123-1-8 | 411-1-1 |

| New Expenditure Head as Per Revised Budget 2022 | Vote Particulars as per Revised Budget 2022 (Appropriation Act No. 21 of 2022) | Vote Particulars as per Initial Budget 2022 (Appropriation Act No. 30 of 2021) |
|---|---|---|
| | 123-1-9 | 411-1-2 |
| | 123-2-10 | 411-2-3 |
| | 123-1-12 | 415-1-1 |
| | 123-1-13 | 415-1-2 |
| | 123-1-14 | 415-1-3 |
| | 123-2-15 | 415-2-4 |
| | 123-1-16 | 417-1-1 |
| | 123-1-17 | 417-1-2 |
| | 123-2-18 | 417-2-3 |
| | 123-1-19 | 443-1-1 |
| | 123-1-20 | 443-1-2 |
| | 123-2-21 | 443-2-3 |
| **126** | **Ministry of Education** | |
| | 126-1-02 | 126-1-02 & 403-1-05 |
| | 126-2-03 | 126-2-03 & 403-2-06 |
| | 126-2-05 | 126-2-05 & 422-2-03 |
| | 126-2-07 | 126-2-07 & 403-2-07 |
| | 126-1-12 | 404-1-01 |
| | 126-1-13 | 404-1-02 |
| | 126-1-14 | 422-1-01 |
| | 126-1-15 | 422-1-02 |
| | 126-1-16 | 421-1-01 |
| | 126-1-17 | 421-1-02 |
| | 126-1-18 | 421-1-03 |
| | 126-2-19 | 421-2-04 & 444-2-3-004 , 444-2-3-005, 444-2-3-006, 408-2-3-001 |
| | 126-2-20 | 421-2-05 |
| | 126-2-21 | 421-2-06 |
| **130** | **Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government** | |
| | 130-01-15 | 409-01-01 |
| | 130-01-16 | 409-01-05 |
| | 130-01-17 | 409-01-06 |
| | 130-01-18 | 420-01-01 |
| | 130-01-19 | 420-01-02 |
| | 130-02-20 | 409-02-08 |
| | 130-02-21 | 420-02-03 |
| **135** | **Ministry of Plantation Industries** | |
| | 135-02-03-018 | 102-01-02-26 |
| | 135-02-04-010 | 102-01-02-25 |
| | 135-02-03-012 | 102-01-02-27 |
| | 135-02-04 | 135-02-04 , 410-02-4 , 431-2-4 & 432-2-4 |
| | 135-01-05 | 410-01-01 |
| | 135-01-06 | 410-01-02 |
| | 135-02-07 | 410-02-03 |

| New Expenditure Head as Per Revised Budget 2022 | Vote Particulars as per Revised Budget 2022 (Appropriation Act No. 21 of 2022) | Vote Particulars as per Initial Budget 2022 (Appropriation Act No. 30 of 2021) |
|---|---|---|
| | 135-01-08 | 431-01-01 |
| | 135-01-09 | 431-01-02 |
| | 135-02-10 | 431-02-03 |
| | 135-01-13 | 432-01-01 |
| | 135-01-14 | 432-01-02 |
| | 135-02-15 | 432-02-03 |
| **149** | **Ministry of Industries** | |
| | 149-02-03-004 | 439-2-3-004 |
| | 149-02-05-009 | 439-2-3-001 |
| | 149-02-05-001 | 439-2-3-003 |
| | 149-02-05-018 | 440-2-3-001 |
| | 149-01-08 | 439-01-01 |
| | 149-01-09 | 439-01-02 |
| | 149-01-10 | 408-01-01 |
| | 149-01-13 | 408-01-02 |
| | 149-02-14 | 408-02-03 except 408-2-3-001 |
| | 149-01-15 | 440-01-01 |
| | 149-01-16 | 440-01-02 |
| **151** | **Ministry of Fisheries** | |
| | 151-01-05 | 405-01-01 |
| | 151-01-06 | 405-01-02 |
| | 151-02-07 | 405-02-03 |
| | 151-02-04 | 405-02-04 |
| **160** | **Ministry of Environment** | |
| | | |
| **161** | **Ministry of Wildlife and Forest Resources Conservation** | |
| | 161-01-04 | 424-01-01 |
| | 161-01-05 | 424-01-02 |
| **166** | **Ministry of Water Supply** | |
| | 166-01-14 | 433-01-01 |
| | 166-01-15 | 433-01-02 |
| | 166-02-16 | 433-02-03 |
| **171** | **Ministry of Women, Child Affairs and Social Empowerment** | |
| | 171-01-01 | 414-01-01 |
| | 171-01-02 | 414-01-02 |
| | 171-02-03 | 414-02-03 |
| | 171-02-07 | 414-02-07 |
| | 171-01-04 | 403-01-01 |
| | 171-01-05 | 403-01-02 |
| | 171-02-06 | 403-02-03 |
| | 171-02-08 | 403-02-04 |
| | 171-02-09 | 441-02-03 except 441-02-03-2509 and 441-02-03-005-2509 |
| **176** | **Ministry of Ports, Shipping and Aviation** | |
| | 176-01-06 | 434-01-01 |
| | 176-01-07 | 434-01-02 |
| | 176-01-08 | 437-01-01 |

| New Expenditure Head as Per Revised Budget 2022 | Vote Particulars as per Revised Budget 2022 (Appropriation Act No. 21 of 2022) | Vote Particulars as per Initial Budget 2022 (Appropriation Act No. 30 of 2021) |
|---|---|---|
| | 176-01-09 | 437-01-02 |
| | 176-02-10 | 434-02-03 |
| | 176-02-11 | 437-02-03 |
| **186** | **Ministry of Technology and Investment Promotion** | |
| | 186-2-03- 005 | 444-2-3-003 |
| **187** | **Ministry of Investment Promotion** | |
| | 187-01-01 | 444-01-01 |
| | 187-01-02 | 444-01-02 |
| | 187-01-03 | 442-01-03 |
| | 187-02-04 | 444-2-3-001 , 444-2-3-002 |
| **189** | **Ministry of Public Security** | |
| | 189-01-02- 002 | 112-02-02-005 |
| | 189-01-04 | 445-01-01 |
| | 189-01-05 | 445-01-02 |
| **193** | **Ministry of Labour and Foreign Employment** | |
| | 193-01-13 | 412-01-01 |
| | 193-01-14 | 412-01-02 |
| **194** | **Ministry of Youth and Sports** | |
| | 194-01-11 | 402-01-01 |
| | 194-01-12 | 402-01-02 |
| | 194-02-13 | 402-02-01 |
| | 194-02-14 | 402-02-03 |
| | 194-02-15 | 402-02-04 |
| **198** | **Ministry of Irrigation** | |
| | 198-01-08 | 428-01-01 |
| | 198-01-09 | 428-01-02 |
| | 198-02-10 | 428-02-03 |
| | 198-01-12 | 429-01-01 |
| | 198-01-14 | 429-01-02 |
| | 198-02-15 | 429-02-03 |